පදිංචිකරුවෙක් (තැරැව්කරුවකු ලෙස සිට) පිටස්තරයකුට විකිණීම අල්ලාහ්ගේ දූතයාණන් (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තහනම් කළේය. එමෙන්ම නුඹලා එකිනෙකාට එරෙහිව මිල ඉහළ නැංවිය නොයුතුය. පුද්ගලයකු තම සහෝදරයාගේ ව්යාපාරයට එරෙහිව ව්යාපාර නොකළ යුතුය. ඔහුගේ විවාහ තීන්දුවට එරෙහිව විවාහ තීන්දුවක් නොකළ යුතුය.

අබූ හුරෙයිරා (රළියල්ලාහු අන්හු) තුමා විසින් වාර්තා කරන ලදී. “පදිංචිකරුවෙක් (තැරැව්කරුවකු ලෙස හිඳ) පිටස්තරයකුට විකිණීම අල්ලාහ්ගේ දූතයාණන් (සල්ලල්ලාහු
අලයිහි වසල්ලම්) තහනම් කළේය. එමෙන්ම නුඹලා එකිනෙකාට එරෙහිව මිල ඉහළ නැංවිය
නොයුතුය. පුද්ගලයකු තම සහෝදරයාගේ ව්යාපාරයට එරෙහිව ව්යාපාර නොකළ යුතුය.
ඔහුගේ විවාහ තීන්දුවට එරෙහිව විවාහ තීන්දු නොකළ යුතුය. කාන්තාවක් ඇයගේ භාජනයේ
ඇති දෑ ප්රමාණවත් කරනු පිණිස (අයිතිය භුක්ති විඳිනු පිණිස) ඇයගේ සහෝදරියගේ දික්කසාදය ඉල්ලා නොසිටිය යුතුය.” [පූර්ව සාධක සහිත හදීසයකි] [බුහාරි හා මුස්ලිම් හි වාර්තා වී ඇත]

මුස්ලිම් සමාජයේ පුද්ගලයින් අතර සතුරුකම හා ක්රෝධය ඇති වීමට හේතුවන සියලු කරුණු ඉවත් කිරීමට පිවිතුරු දහම අපේක්ෂා කරයි. මෙම ප්රකාශය තුළ එය පැහැදිලිව ඉස්මතු වී ඇත. මිලදී ගැනීමේ අපේක්ෂාවෙන් තොරව භාණ්ඩයක මිල අධික කිරීම මෙහි තහනම් කර ඇත. සැබැවින්ම එය වැඩි වටිනාකමක් ලබා විකුණුම්කරුට ප්රයෝජනවත් වනු ඇත. එසේ නැතහොත් භාණ්ඩයේ මිල වැඩි වීම හේතුවෙන් ගැනුම් කරුට පීඩනයක් ඇතිවනු ඇත. මෙම පෙළගැස්ම නිසාවෙන් ගනු දෙනු කරන්නන් රැවටීම, බොරු කිරීම, කූට හා වංචනික ලෙසින් භාණ්ඩයේ මිල ඉහළ නැංවීම යනාදිය වළක්වා ඇත. එමෙන්ම පදිංචිව සිටින්නා (තැරැව්කරුවකු ලෙස සිට) පිටස්තරයාට ඔහුගේ භාණ්ඩ විකිණීම තහනම් කළේය. ඊට හේතුව සැබැවින්ම එය මිලෙන් එය වට වී ඇති බැවිනි. එබැවින් ගැනුම් කරුවන්ට ප්රයෝජනවත් වන කිසිවක් ඉන් අඩු නොකළ යුතුයි. නබි (සල්ලලාලහු අලයිහි වසල්ලම් තුමා) මෙසේ පැවසූහ. “නුඹලා ජනයාව අතහැර දමනු. අල්ලාහ් ඇතැමෙකුගෙන් ඇතැමෙකුට පෝෂණය සපයනු ඇත.” භාණ්ඩ අයිතිකරු විසින්ම තමන්ට ප්රමාණවත් මිලකට ඒවා විකුණා දැමූ විට මිලදී ගන්නන් හට එම භාණ්ඩය හොඳ මිලකට ලැබෙනු ඇත. තම සහෝදරයාට තීන්දු කළ විවාහයකට එරෙහිව එම තීන්දුවෙන් ඔහු ඉවත් වී ඇති බව හෝ එයට පිළිතුරක් නොදුන් බවට දැනගන්නා තෙක් එසේ විවාහ තීන්දු කිරීම තහනම් කර ඇත. වෙනත් කෙනෙකුට කළ යෝජනාවකට එරෙහිව විවාහ යෝජනාවක් කිරීම සතුරුකමට ක්රෝධයට හේතුවන වන අතර ජීවිත හානිවලට ද නිරාවරණය වනු ඇත. කාන්තාවක් ඇයගේ ස්වාමි පුරුෂයාගෙන් ඇයව දික්කසාද කරන මෙන් ඉල්ලීම හෝ ඇයට එරෙහිව තම හදවත වෙනස් කර ගන්නා මෙන් හෝ ඔවුන් අතර නපුරක් වී ඔහු ඇයව වෙන් කරන අයුරින් අර්බුද ඇති කිරීම හෝ තහනම් කර ඇත. එහි සතුරුකම් උරුම කර දීම, අනුකම්පා විරහිත වීම වැනි බරපතල ද්රෝහිකම් සිදුවන අතර විවාහය හේතුවෙන් ඇයගේ කුසට ප්රමාණවත් වන යහපත් ආහාර, වියහියදම්, ඇඳුම් පැළදුම් මෙන් බිරියට කළ යුතු යුතුකම් අතරින් ඔහු වෙත අනිවාර්යය වන පෝෂණ සම්පත් ද කප්පාදු වී යනු ඇත.

